**ශීර්ෂය - 298 මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

1.1 **තත්ත්වාගණනය කළ මතය**

---

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.4 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමඟ අනුරූපි වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

1.5 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාර වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරී ඔහුගේ රැස් කළ ආදායම්, ආදායම් නොවන ලැබීම් යටතේ ඇතුළත් කර නොතිබුණු අතර එය බදු නොවන ආදායම් යටතේ ඇතුළත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කරමි. | ඉදිරියේදී නියමිත අනු කොටස් යටතේ වර්ග කර දැක්වීමට කටයුතු කරමි. |
| (ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය ලෙස රු.10,967,693 ක් දක්වා තිබුණද, දෙපාර්තමේන්තු පොත් අනුව එදිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු. 5,080,770 ක් වී තිබුණි. රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(vi) ඡේදය ප්‍රකාරව එම ශේෂ 02 හි වෙනස සැසඳීම සඳහා අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කළ වුවත්, එවැනි ගිණුමක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී සකස් කර ඉදිරිපත් කරනු ලැබේ. |
| (ඇ) විගණනයට ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ අනුව භාණ්ඩාගාරයෙන් රු.145,955,637 ක් ලැබී තිබුණි. නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අග්‍රිම ලැබීම් ලෙස රු.152,881,199 ක් දක්වා තිබුණි. ඒ අනුව රු.6,925,562 ක් භාණ්ඩාගාර අග්‍රිම වැඩියෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම නිවැරදිව ලේඛනගත කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ඇතුළත් කිරීම සිදු කළ යුතු විම. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ නිවැරදි කිරීම් සිදුකරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉහත (ඇ) ඡේදයේ සඳහන් භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම වැඩියෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා තිබීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.6,925,562 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි ලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කෙරෙහි අවධානය යොමු කරවමි. | 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |

**1.6.2** **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

**--------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය**<br>**---------------------** | **නිර්දේශය**<br>**-----------** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>**-------------------------------** |
|---|---|---|---|
| **(අ)** | දේපල පිරියත හා උපකරණවල එකතුව ලෙස රු.මිලියන 1,151.89 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ ඇතුළත් වත්කම් අයිතම 03 ක එකතුව රු.595,324,560 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | ඉකුත් වර්ෂයේ පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුමේ සඳහන් වත්කම් ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ඉදිරියට ගැනීම හා සියළුම වත්කම් ගිණුම්ගත කිරීම කෙරෙහි අවධානය යොමු කරවමි. | දෙපාර්තමේන්තුවට අයත් සියළුම වත්කම් ගිණුම්ගත කර නොමැති බැවින් වටිනාකම අඩුවෙන් පෙන්නුම් කෙරේ. මෙම වසර තුළ සියළුම වත්කම් ගිණුම්ගත කිරීමට අපේක්ෂා කෙරේ. |
| (ආ) | විගණනය වෙත ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් ලේඛනවල භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ලබාගන්නා ස්ථාවර වත්කම් හා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදලෙන් ගනු ලබන ස්ථාවර වත්කම් පහසුවෙන් හඳුනා ගැනිමට හැකිවන පරිදි සටහන් කර නොතිබුණි. එබැවින් “ ඒ සී ඒ 6 ” ප්‍රකාශයෙහි දැක්වෙන වත්කම් වටිනාකම් ශීර්ෂයට අදාළ වත්කම් බව සනාථ කර ගැනීමට නොහැකි විය. | භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ලබාගන්නා ස්ථාවර වත්කම් හා දෙපාර්තමේන්තු අරමුදලෙන් ලබා ගන්නා වත්කම් වෙන වෙනම පැහැදිලිව හඳුනා ගත හැකි ආකාරයෙන් ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කරමි. | භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් හා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදලින් මිලදී ගනු ලබන ස්ථාවර වත්කම් සඳහා වෙන වෙනම ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

### 1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | අදාළ ප්‍රකාශයන් ඉදිරියේදී ඉදිරිපත් කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු. මිලියන 25.00 ක මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. | අමාත්‍යාංශය වෙනස් වීම මත අදාල අනුමැතීන් ලබාගැනීමට නොහැකිවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 සැලසුම් කිරීම**

----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව 2018 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය ඊට ඇතුළත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කරවමි. | නිරීක්ෂණය පිළිගනු ලැබේ. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වෙළඳාමේදී භාවිතා වන කිරුම් හා මිනුම් උපකරණ සඳහා මාදිලි අනුමැතියන් ලබාදීම වෙනුවෙන් රු.1,000,000 ක ඉලක්කගත ආදායමක් රැස්කිරිමට අපේක්ෂා කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් රු.630,000 ක ආදායමක් පමණක් රැස්කර තිබුණි. | අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟා වීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව 2018 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා පෙර ඇසුරුම් 04 ක් පරීක්ෂා කර එමගින් රු.500,000 ක ආදායමක් රැස් කිරීමට ඉලක්ක කර තිබුණි. 2018 සැප්තැම්බර් 30 දින වන විට ඇසුරුම් 02 ක් පමණක් පරීක්ෂා කර රු.20,000 ක ආදායමක් පමණක් උපයා තිබුණි. | ඉලක්කගත පරීක්ෂාවන් ඉටු කර අපේක්ෂිත ආදායම රැස් කිරීම කෙරෙහි අවධානය යොමු කරවමි. | අදහස් දක්වා නැත. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාජ මිනුම් වැටලීම් 15,203 ක් සිදුකර තිබූ අතර ප්‍රමිතියෙන් බැහැර වූ මිනුම් උපකරණ භාවිතා කරන ලද පුද්ගලයින් හා ආයතන 787 කට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණි. වවුනියා, මුලතිව් හා මන්නාරම් දිස්ත්‍රික්වල කිසිදු වැටලීමක් කර නොතිබුණි. | ව්‍යාජ මිනුම් වැටලීම් කටයුතු දිවයින පුරා ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරවමි. | අදහස් දක්වා නැත. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තිය ප්‍රකාරව මුද්‍රා ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව තිබුණත්, 2019 මැයි 31 දින වන විටත් එලෙස කටයුතු කර ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කරවමි. | ඉදිරියේදී වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබුණද, දත්ත රැස්කිරීම සඳහා වන සැලැසුමක් හෝ වැඩ සටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අවශ්‍ය වන දත්ත රැස්කර ගැනීම සඳහා ක්‍රමවේදයක් කඩිනමින් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කරවමි. | වාර්තාවක් ඉදිරියේදී ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත වී තිබුණද, ඒ සඳහා නිලධාරියෙකු පත්කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | අනුමත වි ඇති අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු පත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරවමි. | විශ්‍රාමික ගණකාධිකාරී සේවයේ නිලධාරියකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අදහස් කරනු ලැබේ. |

**5.2 විගණන හා කළමනාකරණ කමිටුව**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 ජනවාරි 28 දිනැති අංක ඩීඑම්ජ්/2009(I)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 2 වන ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කරවමි. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු බඳවා ගත් පසු විගණන කමිටු රැස්වීම් පවත්වනු ලැබේ. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුරට පූර්ණ කාලීන නිලධාරියකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව කළ යුතුව තිබුණි. 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව වැඩ බැලීමේ කාලය මාස 03 ක උපරිමයකට යටත් විය යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ජ්‍යොෂ්ඨ තනතුර වන අධ්‍යක්ෂ තනතුර, 2009 මැයි 14 දින හිටපු අධ්‍යක්ෂකවරයා විශ්‍රාම යාමෙන් පසු එදින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා එනම් වසර 09 ක කාලයක් පුරප්පාඩුවී පැවතුණු අතර එම තනතුරෙහි වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු පත්කර තිබුණි. | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය හා 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කරවමි. | අමාත්‍යාංශය විසින් අයදුම්පත් කැඳවා බඳවා ගැනීම් කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | අනුමත ජ්‍යොෂ්ඨ මට්ටමේ තනතුරු 19 ක් අතරින් තනතුරු 06 ක් පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ ඉහළ කාර්යභාරය ඉටු කළ හැකි වන පරිදි පුරප්පාඩු පිරවීම කෙරෙහි අවධානය යොමු කරවමි. | සහකාර අධ්‍යක්ෂ (පාලන) සහ අභ්‍යන්තර විගණක තනතුරු සඳහා පත් කිරීම් කරන ලෙස රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. |
| (ඇ) | පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පවතින අතර ඒ සඳහා වැඩබැලීමේ පදනමින් නිලධාරියෙකු පත්කර රාජකාරී ආවරණය කර ඇත. දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු බාධාවකින් තොරව ඉටු කරලීම සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කිරීම කෙරෙහි අවධානය | පුරප්පාඩු පිරවීම කෙරෙහි අවධානය යොමු කරවමි. | පරිපාලන නිලධාරී තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. |

යොමුකර නොතිබුණි.